# සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක මඟින් හෙළිවන අතීත විදේශීය වෙළෙඳ සබඳතා (කිරින්ද හා ගාල්ල වරාය ඇසුරෙන්)

**පී.ආර්. අසංක බුද්ධිකසිරි**

කැනීම් අංශය, සීගිරිය ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, සීගිරිය.

asanka.buddikasiri8@gmail.com

මුඛ්‍ය පද : විදේශ වෙළදාම, සමුද්‍ර පුරාවිද්‍යාව, සාධක

**හැඳින්වීම**

සමුද්‍ර පුරාවිද්‍යාවේ දී මුහුදු පත්ලේ ගිලුණු නැව් හා ඒවා නිර්මාණය කළ තාක්ෂණය ඇතුළු හමුවන සියලු ම පුරාකෘති පිළිබඳ අධ්‍යයනය කරන අතර මුහුද හා සම්බන්ධ ව සිදු කෙරෙණු සෑම මානව ක්‍රියාවක් පිළිබඳ ව අධ්‍යයනය කරනු ලබන විෂයකි. රටවල් අතර තිබූ සබඳතා, සාගරය හරහා සිදු කළ අන්තර් ජාතික වෙළඳාම, ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමේ දී භාවිත කරනු ලැබූ වරායන්, වෙරළබඩ වැසියන්ගේ සමාජ ආර්ථික ජීවිතය, මුහුදු ආශ්‍රිත ව ජීවත් වීමෙන් හැඩගැසුණු සංස්කෘතීන් ඇති පැරණි ජන කොටස්, ග්‍රාම, නගර, රටවල් විශේෂයෙන් දූපත් පිළිබඳ අධ්‍යයනය කිරීම සමුද්‍ර පුරාවිද්‍යාවේ දී අවධානයට ලක් වේ. වර්තමානය වන විට සමුද්‍ර පුරාවිද්‍යාඥයින් නාවිකයන්ගේ ජීවන රටා (shipboard life) නැව්වලින් ප්‍රවාහනය කළ භාණ්ඩ වර්ග මුහුදු වෙළෙඳ මාර්ග පිළිබඳ මෙන් ම පුරාණ ලෝහ විද්‍යාව (Earily Metalurgy) වීදුරු නිෂ්පාදන හා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මානවයා මුහුදු ආශ්‍රිත ජීවිතයට හුරු වූ ආකාරය පිළිබඳ පවා හැදෑරීමට යොමු වී ඇත. මූලික ගැටලුව ලෙස ජාත්‍යන්තර වෙළෙඳාම තුළ ශ්‍රී ලංකාවට හිමි වූ විශේෂ අවධානය පිළිබඳ සාධක සනාථ කිරීම සඳහා සුමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක කෙසේ දායකවේ ද යන්න අධ්‍යයනය කරනු ලැබේ. ශ්‍රී ලංකාව විදේශීය රාජ්‍යයන් සමඟ කටයුතු කිරීම ආරම්භ වූයේ පූර්ව ඓතිහාසික යුගයේ සිට වුවත් එහි වර්ධනයක් පෙන්නුම් කරනු ලබන්නේ මුල් හා මධ්‍ය ඓතිහාසික යුගයේ සිට ය. ඓතිහාසික, මධ්‍ය කාලීන හා පශ්චාත් මධ්‍ය කාලීන යුගයන්වල බොහෝ විට මේ ස්වභාවය අතිශය වර්ධනය වී ඇති බව සාධක විමර්ශනයෙන් පෙනීයයි.

**ක්‍රමවේදය**

සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක මඟින් හෙළිවන අතීත විදේශීය වෙළෙඳ සබඳතා යන මාතෘකාව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කිරීමේ දී ප්‍රධාන වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය

සඳහා ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර පරිශීලනය කිරීම, පූර්ව පර්යේෂණ අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකරනු ලැබී ය. මෙහි දී මූලාශ්‍ර ග්‍රන්ථ ඔස්සේ සඳහන් වන්නා වූ කරුණු සමුද්‍ර පුරාවිද්‍යාත්මක ව තහවුරු කර ගැනීම මෙහි ප්‍රධාන ගැටලුව වූ අතර, එය තහවුරු කරගන්නා ක්‍රමවේදයක් ලෙස සමුද්‍ර පුරාවිද්‍යාත්මක දත්ත ඔස්සේ අධ්‍යයනය සිදු කරනු ලැබී ය. එ මඟින් මූලාශ්‍ර ග්‍රන්ථවල සඳහන් වන්නා වූ තොරතුරු සහ සඳහන් නොවන්නා වූ තොරතුරු පිළිබඳ නිවැරදි අවබෝධයක් මේ සාධක ඔස්සේ අධ්‍යයනය කළ හැකි වේ.

මෙම පර්යේෂණයේ දී ශ්‍රී ලංකාව විදේශ රාජ්‍යයන් සමඟ පැවති වෙළඳාම පිළිබඳ ව සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ කරුණු අධ්‍යයනය කරනු ලබන අතර එම පර්යේෂණ සඳහා උපයෝගි කරගනු ලබනුයේ ප්‍රධාන වශයෙන් දකුණු පළාත ආශ්‍රිත ප්‍රදේශය යි. එහි ද කිරින්ද ආශ්‍රිත ව ඇති මහා රාවණා හා කුඩා රාවණා ගල්පරයන් ආශ්‍රයෙන් හමු වූ සාධක පිළිබඳවත්, ගාලු වරාය ආශ්‍රිත සාධක පිළිබඳවත්, අවධානය යොමු කරනු ලැබී ය.

දකුණු පළාත යනු අතීතයේ සිට ම විදේශ වෙළෙඳාම සඳහා ප්‍රසිද්ධ ව පැවති කලාපයක් වශයෙන් පෙන්වා දිය හැකි අතර එම ප්‍රදේශය පිළිබඳ ව ලිය වී ඇති මූලාශ්‍ර ග්‍රන්ථ පරිශීලනය කිරීම තුළින් ද පැහැදිලි වන්නකි. මෙම පර්යේෂණයේ දී පර්යේෂණ කලාපය වශයෙන් දකුණු පළාත උපයෝගී කර ගනිමින් මෙම ශාස්ත්‍රීය අධ්‍යයනය සිදු කරනු ලැබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මධ්‍යගත ව පිහිටා තිබීම නිසාත් පෙර අපර දෙ දිග වෙළෙඳාමේ මධ්‍යස්ථානයක් වශයෙන් පවතින නිසාත් ප්‍රාග් ඓතිහාසික, ඓතිහාසික, මධ්‍ය කාලීන හා පශ්චාත් මධ්‍ය කාලීන යුගයන්වල සිට විදේශීය රටවල් සමඟ සබඳතා පැවති බවට සාහිත්‍ය මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන්ගෙන් ද අනාවරණය වේ. මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාව විදේශ රටවල් සමඟ පැවති වෙළෙඳ සබඳතා පිළිබඳ සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ අධ්‍යයනය කරනු ලබයි. එම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් දකුණු පළාත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් එම ප්‍රදේශ ආශ්‍රිත ව සිදු කළ පර්යේෂණවලින් හමු වූ සාධක ඔස්සේ කරුණු පෙන්වා දී ඇත. ගාල්ල වරාය ආශ්‍රිත ව හමු වූ සාධක පිළබඳවත්, කිරින්ද වරාය ආශ්‍රිත ව ඇති මහාරවණා හා කුඩරාවණා ගල්පරයන කලාප කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ අතීත විදේශ වෙළඳාම පිළිබඳ සාධක ඉදිරිපත් කොට ඇත.

සාහිත්‍ය මූලාශ්‍රය වල සඳහන් කරන පරිදි ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාමේ වර්ධනයක් පෙන්නුම් කරනුයේ පහළොස් වැනි හා දහසය වැනි සියවසේ සිට ය. ඊට පෙර අවදීන්වල යම් යම් ජාතිකයන් ලක්දිව වෙළෙඳාම

පිණිස පැමිණි බවට මූලාශ්‍රවල සඳහන් වුව ද එහි සීඝ්‍ර වර්ධනයක් ඇති වූයේ මධ්‍ය කාලීන අවධියේ දී ය.

විදේශ වෙළෙඳ කටයුතු දියුණු තත්ත්වයක පැවති බවට දේශීය මෙන් ම විදේශීය මූලාශ්‍රවල සඳහන් වේ. චීන, පර්සියන්, අරාබින් සහ වෙනත් වෙළෙඳ කණ්ඩායම් මධ්‍ය කාලීන අවධිය වන විට ශ්‍රී ලංකාව සමඟ වෙළෙඳ කටයුතු පුළුල් වශයෙන් පැවති බව එම මූලාශ්‍ර ග්‍රන්ථ පරිශීලනය කිරීමේ දී පැහැදිලි වේ. මූලාශ්‍ර ග්‍රන්ථවල සඳහන් වන්නා වූ තොරතුරු සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් තහවුරු කර ගැනීමට පුරාවිද්‍යාඥයින්ට අවශ්‍ය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 1960 දශකයේ දී පර්යේෂණ කටයුතු මහාරාවණා හා කුඩාරාවණා ගල් පරයන් ආශ්‍රිත ව එහි දී රිදී කාසි නෞකාව, බෝතලේ නැව, තඹ නැව හා එච්.එම්.එස් ඩොඩලස් නැවඇතුළු තවත් සාධක කිහිපයක් සොයා ගනු ලැබී ය. මෙම සාධක හමු වීමත් සමඟ මෙම පර්යේෂණ කටයුතු පුළුල් වූ අතර ඒ අනුව 2001 වර්ෂයේ දී ගාල්ල වරාය ආශ්‍රිත ව හමු වූ *ඇවොන්ස්ටාර් හර්කියුලිස්* වැනි ගිලී ගිය නෞකා ඇතුළු තවත් සාධක බොහොමයක් එහි දී වැදගත් වනු ඇත.

මෙම ව්‍යාපෘති ඔස්සේ සිදුකරන ලද පර්යේෂණ අනුව පැහැදිලි වනුයේ ඓතිහාසික, මධ්‍ය කාලීන, පශ්චාත් මධ්‍ය කාලීන යුගවල දී ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම වර්ධනය වී ඇති බවයි. දකුණු පළාත ආශ්‍රිත ව පිහිටා ඇති වරායන් ද විදේශ වෙළඳාමේ දී වැදගත් වන අතර එම වරායන් අතීතයේ දී සක්‍රීය ව පැවති බවට පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඔස්සේ පැහැදිලි වේ. මධ්‍ය කාලීන අවධියේ දී සාධක බොහොමයක් තවමත් නිසි ආකාරයෙන් ඉදිරිපත් වී නොමැති වුවත් පශ්චාත් මධ්‍ය කාලීන යුගයේ පැවති විදේශ වෙළෙඳ සබඳතා පිළිබඳ තොරතුරු වාර්තා වී ඇත. ගාල්ල වරාය ආශ්‍රිත හමු වූ ඉන්දු අරාබි ගල් නැංගුරම සහ තවත් සාධක අනුව සඳහන් කළ හැකි ය. ක්‍රිස්තු වර්ෂ 1505න් පසු විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් තොරතුරු සෙවීමේ දී බොහෝ විට යටත්විජිත අවධියේ දී පැවති ආර්ථික සබඳතා වැදගත් වනු ඇත.

සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ පෘතුගීසි අවදියේ දී විදේශ වෙළඳාම පැවති බවට සාධක හමුවන අතර ලන්දේසි අවධිය වන විට ඒ පිළිබඳ හමු වූ සාධක බහුල ය. මහාරාවණා හා කුඩා රාවණා ආශ්‍රිත රිදී කාසි නෞකාව, ඇවොන්ස්ටාර් නෞකාව, ආදී සාධක බොහෝමයක් හමු වී ඇත. මේ අනුව පැහැදිලි වනුයේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීමේ ස්වරූපය අනුව ලෝකයේ විවිධ ප්‍රදේශවලින් විවිධ වෙළෙඳ කණ්ඩායම් මෙ රට වෙළෙඳාම පිණිස පැමිණි බවත් එම වෙළෙඳ කණ්ඩායම් ලක්දිව පැවති වෙළෙඳ භාණ්ඩ සහ කුළු බඩු ආදිය රැගෙන ගිය බවත් ඔවුන් මෙ රටට භාණ්ඩ අපනයනය කළ බවත් ය. ඒ බව සමුද්‍ර පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ තහවුරු කිරීමට සමුද්‍ර පුරාවිද්‍යාඥයින්ට අවශ්‍ය අතර ඒ

අනුව දකුණු පළාත ආශ්‍රිත ව සිදු කළ සමුද්‍ර පුරාවිද්‍යා පර්යේෂණ ඔස්සේ තහවුරු කිරීමට සමත් වී ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය ඔස්සේ එම අරමුණ පැහැදිලි වන බව නිගමනය කළ හැකි ය.

### ආශ්‍රිත ග්‍රන්ථ


Bandaranayake, Senaka, Sri Lanka and the Silk Road of the Sea,

Green, J., Devendra, S. and Parthesius, R.1998, **Gall Habour Project** Parthesius, R., 'Het wrak van het VOC - schip Avondster in de haven van Galle (Sri Lanka). Een potentiele bron van kenn*is* over de Europese expansie in Azie.' in: 'Hollanders uit en thuis',

Parthesius, R., Millar, K. 1999 (a.o) Galle Harbour Interim Report, Amsterdam.